පරිගණක සහ පර්යන්ත උපාංග මිලදී ගැනීම සඳහා පිරිවිතර සැකසීම. - 9 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී **පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය, අම්පාර**

➤ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. පහත පරිගණක අතරින් නිශ්චිත ස්ථානයක තබා භාවිතා කරන පරිගණක වර්ගයක් නොවන්නේ,

I. සේවාදායක පරිගණක II. වැඩහල් පරිගණක III. මේස පරිගණක IV. උකුල් පරිගණක

02. පරිගණකයේ දත්ත හා වැඩසටහන් ස්ථිර ව තැන්පත් කිරීමට යොදා ගනු ලබන්නේ,

I. ආදාන උපාංග II. ප්‍රතිදාන උපාංග III. ආචයන උපාංග IV. ප්‍රධාන මතකය

03. ආදාන උපාංගයක් සඳහා උදාහරණයක් වන්නේ,

I. සංදර්ශකය II. සැණෙලි මතකය III. මුද්‍රණ යන්ත්‍රය IV. මයික්‍රොෆෝනය

04. පරිගණකයේ මොළය ලෙස හඳුන්වන්නේ,

I. ප්‍රධාන මතකය II. දෘඪ තැටිය III. මධ්‍ය සැකසුම් ඒකකය IV. ස්පර්ශ තිරය

05. සකසනයේ වේගය මනිනු ලබන ඒකකය වන්නේ,

I. MB II. MHZ III. GB IV. TB

06. Quad Core සකසන තුළ ඇති CPU ප්‍රමාණය වන්නේ,

I. 2 II. 3 III. 4 IV. 5

07. ශබ්දපත තුළ ඇති ලා නිල් (Line in) කෙවෙනිය යොදා ගනු ලබන්නේ ,

I. පරිගණකයට නාදකය සවි කිරීම.

II. පරිගණකයට හිස් බනුව සවි කිරීම.

III. පරිගණකයට මයික්‍රොෆෝනය සවි කිරීම.

IV. පරිගණකයට බාහිර උපාංගයක් හරහා ශබ්ද ලබා දීම.

08. USB කෙවෙනියට සම්බන්ධ කළ නොහැකි පර්යන්ත උපාංගයක් වන්නේ,

I. මුද්‍රණ යන්ත්‍රය II. වෙබ් කැමරාව III. තීරු කේත කියවනය IV. සංදර්ශකය

09. පරිගණක ජාල ගත කිරීම සඳහා භාවිතා කරන කෙවෙනිය වන්නේ,

I. PS/2 II. USB III. RJ 45 IV. VGA

10. පරිගණකයක් මිලදී ගැනීමේ දී සලකා බැලිය යුතු තාක්ෂණික පිරිවිතරයක් නොවන්නේ,

I. වගකීම II. මතක ධාරිතාව III. සකසනයේ වේගය IV. තිරයේ ප්‍රමාණය

➢ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පහත වගුව සම්පූර්ණ කරන්න.

පුද්ගල නාමය	කාර්යය
	පරිගණක ක්‍රමලේඛ සංවර්ධනය කිරීම.
ජාල පරිපාලක	
	තොරතුරු පද්ධති සැලසුම් කිරීම.
වෙබ් සංවර්ධක	

02. පරිශීලක අවශ්‍යතා සඳහා උදාහරණ 04 ක් ලියන්න.

03. හිස්තැන් පුරවන්න.



04. පරිගණකයක් මිලදී ගැනීමේ දී සලකා බැලිය යුතු තාක්ෂණික නොවන කරුණු 04 ක් ලියන්න.

05. මධ්‍ය සැකසුම් ඒකකය ප්‍රමාණය අනුව වර්ග කළ හැකි ආකාර කීයද? ඒ මොනවාද ?

විද්‍යුත් පැතුරුම් පත් - 9 ශ්‍රේණිය

සැකසුම : G.P. මනෝරංගනී

පාසල : අම්/ගාමිණී මහා විද්‍යාලය, අම්පාර

➢ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. වැඩපතක ඉංග්‍රීසි හෝඩියේ අක්ෂර වලින් පෙන්නුම් කරන්නේ,

I. පේළි II. තීරු III. කෝෂ IV. කෝෂ පරාසය

02. තීරුවක් සහ පේළියක් එකතු වන ස්ථානය .... නමින් හැඳින්වේ.

I. කෝෂ පරාසය II. කෝෂය III. නාම කොටුව IV. සූත්‍ර තීරය

03. කෝෂ හැඩසව් කිරීමේ මෙවලමක් නොවන්නේ,

I. II.  III.  IV. 

04. කෝෂ එකෙල්ල කිරීම සහ ස්ථාන ගත කිරීමේ මෙවලමක් වන්නේ,

I.  II.  III. IV.

05. කෝෂයේ ඇති දත්තය මුදල්මය අගයක් බවට පත් කිරීමට යොදා ගන්නා මෙවලම හඳුන්වන්නේ,

I. Number II. Percentage III. Accounting IV. Currency

➢ පහත වැඩපත යොදා ගෙන 6, 7, 8, 9 යන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

	A	B	C	D	E	F
1	නම	විෂය			මුළු ලකුණු	සාමාන්‍යය
2		ගණිතය	විද්‍යාව	ඉංග්‍රීසි		
3	A	85	68	72		
4	B	96	88	75		
5	C	78	97	86		
6	වැඩිම ලකුණු					
7	අඩුම ලකුණු					
8						

06. A ගේ මුළු ලකුණු සෙවීම සඳහා යොදා ගනු ලබන සූත්‍රය වන්නේ,

I. = Sum (B3 : D3) II. = Sum (A3 : D3)

III. Sum (A3 : D3) IV. Sum (B3 : D3)

07. A ගේ වැඩිම ලකුණු සෙවීම සඳහා යොදා ගනු ලබන සූත්‍රය වන්නේ ,

I. = Min (B2 : B5) II. = Max (B2 : B5)

III. = Min (B3 : B5) IV. = Max (B3 : B5)

08. B ගේ සාමාන්‍ය ලකුණු ලබා ගැනීමට අදාළ සූත්‍රය භාවිතා කළ යුතු කෝෂ නාමය වන්නේ,

I. C5 II. F4 III. E3 IV. F3

09. C ගේ අවම ලකුණු සෙවීම සඳහා .... සූත්‍රය භාවිතා වේ.

I. Min (D3 : D5) II. Max (D3 : D5)

III. = Min (D3 : D5) IV. = Max (D3 : D5)

10.  මෙහි දක්වා ඇති ප්‍රස්තාර වර්ගය වන්නේ,

I. ස්තම්භ ප්‍රස්තාර (Column Chart) II. වට ප්‍රස්තාර (Pie Chart)

III. රේඛා ප්‍රස්තාර (Line Chart) IV. තීරු/දඬු ප්‍රස්තාර (Bar Chart)

➢ **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පැතුරුම්පත් යන්න හඳුන්වන්න.

02. පැතුරුම්පත් මෘදුකාංගයේ කාර්යයන් 03 ක් සඳහන් කරන්න.

03. පහත වැඩපතෙහි A, B, C, D ලෙස හඳුන්වා දී ඇති කොටස් නම් කරන්න.



04. පහත ගණනය කිරීම් සඳහා යොදා ගන්නා ශ්‍රිතයන් ලියා දක්වන්න.

I. කෝෂ පරාසයක එකතුව සෙවීම

II. කෝෂ පරාසයක සාමාන්‍යය සෙවීම

III. කෝෂ පරාසයක වැඩිම අගය සෙවීම

IV. කෝෂ පරාසයක වැඩිම අගය සෙවීම

05. විද්‍යුත් පැතුරුම්පත් මෘදුකාංගයේ දී භාවිතයට ගන්නා ප්‍රස්තාර වර්ග 04 ක් ලියන්න.